කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

විවෘත සහ දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රය

ව්‍යාපාර කළමනාකරණවේදී (සාමාන්‍ය) උපාධි

ප්‍රථම පරීක්ෂණය ( බාහිර ) - 2007

**BMGT E 1045 – ව්‍යාපාර නීතිය**

ප්‍රශ්න සංඛ්‍යාව : 08යි. කාලය : පැය 03 යි

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

(01) (අ) "අපර්ණයක්, ප්‍රතිග්‍රහනය කිරීම ඵලදායී වීමට නම් එක්තරා කොන්දේසි කිහිපයක් සම්පූර්ණ විය යුතුය." එම කොන්දේසි මොනවාදැයි දක්වමින් ඉහත ප්‍රකාශය පැහැදිලි කරන්න.

(ලකුණු 08)

(ආ) අමල් සිය ජායා පිටපත් යන්ත්‍රය රු.15000/- විකිණීම පිණිස දිනේෂ් වෙත අර්පණයක් ඉදිරිපත් කරයි. දිනේෂ් ඒ සඳහා රු 14,000/- ගෙවීමට එකග වේ. නමුත් අමල් . එය එම මුදලට දිනේෂ්ට විකිණීම ප්‍රතික්ෂේප කරයි. එවිට දිනේෂ් ඒ සඳහා රු. 15,000/- ගෙවීමට එකග වෙයි. නමුත් අමල් එම යන්ත්‍රය දිනේෂ් වෙත විකිණීම ප්‍රතික්ෂේප කරයි. දැන් දිනේෂ් අමල්ට එරෙහිව ගිවිසුම් කඩ කිරීම මත නඩු පැවරීමට අදහස් කරයි. දිනේෂ්ට උපදෙස් දෙන්න.

(ලකුණු 06)

(ඇ) තමා උගන්වන විෂය උදෙසා පවත්වන විභාගයේ ප්‍රශ්න පත්‍රය උදෙසා ලකුණු 70% හෝ ඊට වැඩියෙන් ලබා ගන්නා සිය පංතියේ ඕනෑම සිසුවෙකු වෙත රු 5000/- ත්‍යාගයක් පිරිනැමීමට ගුරුවරයෙකු පොරොන්දු වෙයි. අරුණ එම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 75% ක් ලබා ගත්තේය. තමා වෙත රු. 5000/- ගෙවන ලෙස ගුරුවරයාට බල කිරීමට අරුණට හැකිවේද?

(ලකුණු 06)

(02) (අ) පහත සඳහන් ප්‍රකාශයන් වැරදි හෝ නිවැරදි දැයි දක්වන්න.

(i) බාලවයස්කරුවෙකුගේ යහපත පිණිස ඔහු සමග ඇතිකර ගත් ගිවිසුමක් බලාත්මක කළ නොහැක.

(ii) වැඩිහිටියෙකු වෙත බාලවයස්කරුවෙකු විසින් ණය පදනම මත විකුණු භාණ්ඩවල මිල වැඩිහිටියාගෙන් අය කර ගැනීමට ඔහුට පුළුවන.

(iii) වැඩිහිටියෙකු බවට පත් වීමෙන් පසුව බාලවයස්කරුවෙකුට තමන් එළඹුණු ගිවිසුම් අනුමත කළ හැකිය.

(iv) ප්‍රකෘති මනසක් නොමැති තැනැත්තෙකු හැදූ ගිවිසුමක් හිස් වේ.

(v) විවාහක කාන්තාවකට වලංගු ගිවිසුමකට එළඹිය නොහැක.

(ලකුණු 05)

(ආ) එක්තරා ස්වර්ණාභරණ වෙළඳසැලක් වෙත යන X, ස්වර්ණාභරණ කිහිපයක් තෝරා ගනියි. එම ප්‍රදේශයේ පදිංචි ප්‍රසිද්ධ පුද්ගලයෙකු වන Y ගේ නමින් ලියන ලද චෙක්පතක් ඔහු ලබා දෙයි. එවිට ස්වර්ණාභරණ වෙළඳසැල් හිමියා එම චෙක්පත භාරගෙන, ස්වර්ණාභරණ රැගෙන යාමට X වෙත ඉඩ දෙයි. X , එම ස්වර්ණාභරණ, මෙම වංචාව පිළිබඳ කිසිත්

නොදත් Z වෙත උකසට තබයි. ස්වර්ණාභරණ වෙළඳසැල් හිමියාට මෙම ස්වර්ණාභරණ Z වෙතින් නැවත ලබා ගත හැකිද? Z වංචාව පිළිබඳ දැන සිටියේ නම් ඔබගේ පිළිතුර වෙනස් වේද?

(ලකුණු 09)

(ඇ) සුදුසු උදාහරණ යොදා ගනිමින් "පූර්ව ගිවිසුම් කඩ කිරීම" සහ "සත්‍ය ගිවිසුම් කඩ කිරීම" අතර වෙනස පෙන්වා දෙන්න. පූර්ව ගිවිසුම් කඩ කිරීමෙහි ප්‍රතිඵල කවරේද?

(ලකුණු 06)

(03) (අ) ප්‍රසාද්ගේ ව්‍යාපාරයෙහි නියෝජිතයා වශයෙන් තමා කටයුතු කරන බැව් ප්‍රසාද් ඉදිරිපිටදී ඔහුට ඇසෙන සීමාවේ සිට ජෝන්, කපිල වෙත ප්‍රකාශ කරයි. නමුත් එම ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රසාද් විරෝධතාවක් දක්වන්නේ නැත. ඉන් අනතුරුව ජෝන්, ප්‍රසාද් ගේ නියෝජිතයා බැව් අවංකව විශ්වාස කරමින්, කපිල, ජෝන් සමග ගිවිසුමකට එළඹෙයි.

සත්‍ය වශයෙන්ම ජෝන් ප්‍රසාද්ගේ නියෝජිතයා නොවූනත් එම ගණුදෙනුව සම්බන්ධයෙන් ප්‍රසාද් වගකිව යුතුද?

(ලකුණු 06)

(ආ) "ප්‍රධානියා විසින් නියෝජිතයා වෙත බලය පවරා දී ඇති හෙයින් නියෝජිතයෙකුට තවදුරටත් තමා වෙත ලබා දී ඇති බලතල වෙනත් කෙනෙකුට පැවරිය නොහැක." නමුත් ඇතැම් අවස්ථාවලදී නියෝජිතයෙකුට, උප නියෝජිතයෙකු පත් කළ හැකිය.

නියෝජිතයෙකු විසින් උප නියෝජිතයෙකු පත් කරනු ලබන විවිධ වූ අවස්ථා මොනවාදැයි සුදුසු නිදසුන් සහිතව පැහැදිලි කරන්න.

(ලකුණු 08)

(ඇ) පාර්ශවයන්ගේ ක්‍රියාකාරීත්වය තුලින් නියෝජ්‍යත්ව සම්බන්ධතාවය අවසන් වන්නේ කෙසේදැයි සුදුසු නිදසුන් සහිතව පැහැදිලි කරන්න.

(ලකුණු 06)

(04) (අ) පහත සඳහන් ඒවා "විකිණීමේ ගිවිසුම්" දැයි හේතු සහිතව පිළිතුරු සපයන්න.

(i) X තමාගේ ශීතකරණය Y වෙත විකිණීමට එකග වන අතර ඒ වෙනුවට Y ඔහුගේ DVD යන්ත්‍රය X ට ලබාදෙයි.

(ii) X, Y වෙත කෘතිම දත් කුට්ටමක් සාදා දීමට පොරොන්දු වෙයි. අවශ්‍ය අමුද්‍රව්‍ය X විසින් සොයා ගනු ලබන අතර එය සාදා නිම කළ විට මුදල් ගෙවීමට Y පොරොන්දු වෙයි.

(iii) P, ගෘහ භාණ්ඩ R වෙතින් මිළදී ගනියි. ගිවිසුමට අනුව කවර තත්ත්වයක් යටතේ වුවද ගිවිසුම අවසන් කිරීමට P ට නොහැකි අතර එක් වාරිකයක් හෝ P නොගෙව්වහොත් එම ගෘහ භාණ්ඩ නැවත ලබා ගැනීමට R ට හැකිය.

(iv) B , එක්තරා පොත් තොගයක් C වෙත "විකිණීමේ හෝ ආපසු එවීමේ පදනම" මත යවනු ලැබේ.

(ලකුණු 08)

(ආ) "සාම්පල් මගින් විකිණීම" ට අදාල ව්‍යාංග කොන්දේසිය පිළිබඳව භාණ්ඩ විකිණීමේ ආඥා පනතේ විධිවිධාන මොනවාදැයි සාකච්ජා කරන්න.

(ලකුණු 06)

(ඇ) පෙරේරා සිය ගබඩාවේ ඇති සීනි මලු 1000 න් සිල්වා වෙත සීනි මලු 100 ක් විකිණීමට එකග වෙයි. සීනි වල මිල මල්ලක් රු. 2000/- බැගින් මුළු සීනි තොගය සඳහා රු. 200,000/- කි. මෙම සීනි තොගය භාර දීමට පෙර ගබඩාවේ ඇති වූ ගින්නකින් ඒවා මුළුමනින්ම විනාශයට පත්විය. එකගත්වයට අනුව තමා වෙත සීනි සපයන ලෙස පෙරේරාට බල කිරීමට සිල්වාට හැකි වේද?

(ලකුණු 06)

(05) (අ) "ගණුදෙනු කළ හැකි ලියවිල්ලක්" යන්න නිර්වචනය කරන්න.

ගණුදෙනු කළ හැකි ලියවිල්ලක අඩංගු ලක්ෂණ මොනවාදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 02)

(ආ) පහත සඳහන් ප්‍රකාශ සත්‍ය හෝ අසත්‍ය දැයි දක්වන්න. ඔබගේ පිළිතුර සඳහා හේතු දක්වන්න.

(i) රේඛනය කළ චෙක්පත් සඳහා මුදල් ලබා ගැනීමට ඒවා සෘජුවම අණකරුගේ බැංකු කවුන්ටරය වෙත ඉදිරිපත් කළ හැකිය.

(ii) "ගණුදෙණු කළ නොහැක" යනුවෙන් රේඛනය කිරීම නිසා චෙක්පත ගණුදෙණු කළ නොහැකි තත්ත්වයට පත්වේ.

(ලකුණු 06)

(ඇ) බර්නාඩ්. සිය ඥාති පුත්‍රයා වන කැලුම් උපාධිය පංති සාමාර්ථයක් සහිතව සමත් වුවහොත් ඔහුට රු.10,000/- ත්‍යාගයක් දෙන බවට පොරොන්දු වෙයි. කැලුම් විභාගය සමත් වූ අතර බර්නාඩ් රු.10,000/- චෙක්පතක් කැලුම් වෙත නිකුත් කරන ලදි. කැලුම්, පෙරින් සමග විවාහ ගිවිසගෙන සිටි අතර, ඔහු අදාල චෙක්පත පිටසන් කොට ඇයට ත්‍යාගයක් වශයෙන් පිරිනමන ලදි. පෙරින් ෆැපන් හවුස් ආයතනයෙන් මිලදීගත් භාණ්ඩ තොගයක් උදෙසා එම චෙක්පත මගින් ගෙවීම් කරන ලදි. අදාල චෙක්පත තමා ප්‍රිය නොකරන පෙරින් වෙත කැලුම් විසින් දුන් බැව් බර්නාඩ් දැනගත් විට, ඔහු එම චෙක්පත සඳහා මුදල් නොගෙවන ලෙස බැංකුවට උපදෙස් දුනි. අදාල පාර්ශවයන්ගේ වගකීම පිළිබඳ සාකච්ජා කරන්න.

(ලකුණු 06)

(ඈ) පහත සඳහන් දෑ සුදුසු නිදසුන් සහිතව පැහැදිලි කරන්න.

(i) විශේෂ පිටසන

(ii) කොන්දේසිමය පිටසන

(iii) සීමාකාරී පිටසන

(ලකුණු 06)

(06) (අ) සුනිල්, නිමල් සහ පියල් හවුල්කරුවන් ලෙස ව්‍යාපාරයක් පවත්වාගෙන ගියහ. හවුල් ව්‍යාපාරය මගින් එහි තරගකරුවන්ගේ ව්‍යාපාර ගිවිසුම් පිළිබඳ තොරතුරු නීත්‍යානුකූල මාර්ගයෙන් ලබාගැනීම පිණිස නිමල්ව පත් කළේය. නිමල් තරගකාරී හවුල් ව්‍යාපාරයක් පිළිබඳ රහස් තොරතුරු ලබාගැනීම පිණිස එක් ආයතනයක ලිපිකරුවෙකු වෙත අල්ලස් ලබා දුන්නේය. අල්ලස් මුදල ව්‍යාපාරයට අයත් මුදලින් ලබාදුන් අතර එලෙස ලබාගත් තොරතුරු මගින් ලද ලාභය ව්‍යාපාරයේ වත්කම්වලට එකතුවිය. දැන් තරගකාරී ආයතනය පියල්ට එරෙහිව නඩු පැවරීමට අදහස් කරයි.

සිය සම හවුල්කරු වූ නිමල්ගේ ක්‍රියාවන් සම්බන්ධයෙන් සුනිල් සහ පියල් වගකීමට පත්වේදැයි හෝ නොවේදැයි සලකා බලන්න.

(ලකුණු 06)

(ආ) හවුල් ව්‍යාපාර හා තරගකාරීව කටයුතු නොකිරීමට හවුල්කරුවෙකු වෙත වන යුතුකමේ ස්වභාවය දක්වා හවුල්කරුවෙකු මෙම යුතුකම කඩ කලේ නම් අනෙකුත් හවුල්කරුවන් වෙත ඇති ප්‍රතිකර්ම මොනවාදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 04)

(ඇ) "රසපාණිය හිමිකම" යනුවෙන් ඔබ අදහන් කරන්නේ කුමක්ද?

(ලකුණු 06)

(ඈ) රසපාණ ගිවිසුමක් සහ ඔට්ටු ගිවිසුමක් අතර වෙනස්කම් දක්වන්න.

(ලකුණු 04)

(07) (අ) අපරාධ නීතිය සහ සිවිල් නීතිය අතර ඇති වෙනස්කම් හතරක් දක්වන්න.

(ලකුණු 05)

(ආ) සිවිල් නීතිය යටතේ නීති ශාඛා තුනක් නම් කරන්න.

(ලකුණු 03)

(ඇ) සිරිතක්, වලංගු සිරිතක් ලෙස පිළිගැනීම සම්බන්ධයෙන් අදාල වන ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තීන්දු ~~ත ලද නඩු තීන්දු දෙකක් විස්තර කරන්න.

(ලකුණු 04)

(ඈ) ශ්‍රී ලංකා ජනරජයේ අභියාචනාධිකරනයේ අධිකරණ බලය සහ බලතල මොනවාදැයි කෙටියෙන් සාකච්ඡා කරන්න.

(ලකුණු 08)

(08) (අ) කාර්මික ආරවුලක් යනු කුමක්ද යන්න විනිශ්චිත නඩු තීන්දු යොදාගනිමින් පැහැදිලි කරන්න.

(ලකුණු 06)

(ආ) සේවායෝජකයන් විසින් වෘත්තිය සමිති පිළිගැනීම සහ සේවායෝජකයන් විසින් සේවකයන් සම්බන්ධයෙන් අනුගමනය කරන ඇතැම් ක්‍රියාමාර්ග "අසාධාරණ" බැව් නිශ්චය කිරීම පිණිස 1999 දී 1950 අංක 43 දරන කාර්මික ආරවුල් පනත සංශෝධනය කරන ලදි.

(i) "වෘත්තිය සමිති පිළිගැනීම" වශයෙන් ඔබ අදහස් කරනුයේ කුමක්ද?

(ii) සංශෝධිත පනත මගින් අසාධාරන යයි දක්වා ඇති කම්කරු ක්‍රියාමාර්ග මොනවාද?

(ලකුණු 04)

(ඇ) සේවානියුක්තිකයන්ගේ භාර අරමුදල සහ සේවක අර්ථසාධක අරමුදල අතර ඇති ප්‍රධාන වෙනස්කම් දක්වන්න.

(ලකුණු 10)